රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2020

මගේ අංකය: EST-1/MISCL/06/0032
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.10.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගෙන යාම

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීමේ වැඩසටහන් හා සමගාමීව අනෙකුත් රාජ්‍ය සේවා ද බාධාවකින් තොරව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පැනනැඟී ඇත. පවතින තත්ත්වය පිළිබඳව අවධානය යොමු කොට කැපවීමෙන් යුතුව ස්වකීය රාජකාරී උපරිමයෙන් ඉටු කිරීමට සියලුම රජයේ නිලධරයන්ගේ අවධානය යොමු විය යුතු බව මෙයින් අවධාරණය කරමි.

02. කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජයේ ආයතන ප්‍රධානීන් විසින් අනුගමනය කළ යුතු උපදෙස් ඇතුළත් කරමින් ජනාධිපති ලේකම් විසින් නිකුත් කළ 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 චක්‍රලේඛය සහ 2020.05.14 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/21/2020 චක්‍රලේඛය වෙත අවධානය යොමු කර එම චක්‍රලේඛයන්හි සඳහන් උපදෙස් පරිදි නිලධරයන් සේවයට කැඳවීම සහ ආයතන පවත්වා ගෙන යාම කළ යුතු අතර, එකී චක්‍රලේඛයන්හි සඳහන් පරිදි රජයේ නිලධරයන්ගේ සහ මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අනුගමනය කළ යුතු සියලු සෞඛ්‍ය උපදෙස් අනුගමනය කළ යුතු බව ද මෙයින් දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය